# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.02.19 පැය 0810 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/349/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. අනවසරයෙන් රක්ෂිතයක් හෙළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2025.02.18 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාකරේ පොලිස් වසමේ කදිරවේලි රක්ෂිතය භූමියේ කොටසක් හෙළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන අධිකරණ කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාලච්චේන අධිකරණ කාර්යාලය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. බලපත්‍ර කොන්දේසි උල්ලංඝණය කරමින් වැලි පටවමින් සිටි සැකකරුවෙකු ටිපර් රථය සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුර.**

2025.02.18 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මාන්කුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාන්කුලම් පොලිස් වසමේ මල්ලාවි මාගර්යේදී වැටලීමක් සිදු කර බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් ටිපර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවෙකු ටිපර් රථය ද සමඟින් අත්අඩංගුවට ගෙන මාන්කුලම් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**03. බූස්ස බන්ධනාගාරයේ සිදුකළ පරීක්ෂාවකදී ජංගම දුරකථනයක් ඇතුළු උපකරණ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බූස්ස කඳවුර.**

2025.02.18 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බූස්ස කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරු මත බූස්ස බන්ධනාගාරයේ වැටලීමක් සිදුකර **ජංගම දුරකථනයක්, හැන්ඩ් ෆ්‍රී එකක්, සිම්පතක් සහ චාජරයක් සොයාගෙන බන්ධනාගාර පාලනාධිකාරිය වෙත** වෙත භාරදී ඇත.

බූස්ස බන්ධනාගාරය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **නීති විරෝධී මත්පැන් හා මත්පැන් පෙරීමට යොදාගන්නා උපකරණ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2025.02.18 වන දින උදෑසන කාලයේ ලුණුගල පොලිස් වසමේ හෝප්ටන් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 05 මිලි ලීටර් 750 ක්, ගෝඩා ලීටර් 180 ක්, තඹ දඟරයක්, බැරල් 01 ඇතුළු මත්පැන් පෙරීමට යොදාගන්නා උපකරණ ද සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ලුණුගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන හෝප්ටන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ලුණුගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුර.**

2025.02.18 වන දින උදෑසන කාලයේ පස්සර පොලිස් වසමේ ආගරතැන්න ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පස්සර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 20 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පස්සර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන ආගරතැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**